විස්තර පත්‍රිකාව

# වාර්ගිකත්වය මත වෙනසකට ලක් කිරීමේ පනත (Racial Discrimination Act) යටතේ පැමිණිලි

## වාර්ගිකත්වය මත වෙනසකට ලක් කිරීමේ පනත යනු කුමක්ද?

*1975 වාර්ගිකත්වය මත වෙනසකට ලක් කිරීමේ පනත (කොමන්වෙල්ත්)* (RDA) මගින් ඔබගේ වර්ගය, සමෙහි වර්ණය, පෙළපත, ජාතිය හෝ වාර්ගික සම්භවය හෝ සංක්‍රමණ තත්වය මත ඔබට අසාධාරණ ලෙස සැලකීම නීතිවිරෝධීවේ.

එය මගින් වාර්ගික ද්වේශයද නීතිවිරෝධී කර ඇත.

## මෙම නීතිය උපයෝගී කරගත හැක්කේ කුමන අවස්ථාවලද?

පොදු ජීවිතයේ බොහෝ ක්ෂේත්‍රවල සාධාරණ ලෙස සැලකුම් ලැබීමට ඔබට RDA උපයෝගී කරගත හැක:

- **රැකීරක්ෂා** - රැකියාවක් ලබා ගැනීම, රැකියාවක කොන්දේසි, පුහුණුව, උසස්වීම්, සේවයෙන් පහ කිරීම.
- **අධ්‍යාපනය** - පුද්ගලික හෝ රජයේ පාසැල්, විද්‍යාල හෝ විශ්ව විද්‍යාලවලට ඇතුළු වීම හෝ ඉගෙනීම.
- **නවාතැන්** - නිවසක් හෝ තට්ටු නිවසක් කුලියට හෝ මිලට ගැනීම.
- **සේවා ලබාගැනීම හෝ භාවිතය** - රජයේ දෙපාර්තමේන්තු මගින් ලබාදෙන බැංකු සහ රක්ෂණ සේවා, ප්‍රවාහන සහ සන්නිවේදන සේවා, නීතීඥවරුන්, වෛද්‍යවරුන්, හෝ සේවා සපයන අය විසින් ලබා දෙන සේවා, බොජුන් හල් මගින් ලබාදෙන සේවා, සාප්පු සහ විනෝදජනක ස්ථාන.
- **පොදු ස්ථානවලට ප්‍රවේශවීම** - උද්‍යාන, රජයේ කාර්යාල, බොජුන්හල්, හෝටල් හෝ සාප්පු සංකීර්ණ ආදී ස්ථාන.

## වාර්ගීය වශයෙන් වෙනසකට ලක් කිරීම යනු කුමක්ද?

වාර්ගීය වශයෙන් වෙනසකට ලක්කිරීම සිදුවන්නේ සිය වර්ගය, සමෙහි වර්ණය, පෙළපත, ජාතිය හෝ වාර්ගික සම්භවය හෝ සංක්‍රමණ තත්වය හේතුවෙන් වෙනත් අයෙකුට වඩා වෙනස් ආකාරයකට සැලකන අවස්ථාවලදීය. උදාහරණ වශයෙන් දේපල වෙළඳ නියෝජිතයෙකු විසින් නිශ්චිත වාර්ගික පසුබිමකට අයත්වීම, හෝ සමෙහි වර්ණය හේතුවෙන් යම් අයෙකුට නිවසක් කුලියට දීම ප්‍රතික්ෂේප කිරීම 'ඍජු වෙනසකට ලක්කිරීමක්' වේ.

සැම දෙනෙකුටම එකම රීතියක් හෝ ප්‍රතිපත්තියක් ඇතිවිට, වාර්ගික, සමෙහි වර්ණය, පෙළපත, ජාතිය හෝ වාර්ගික සම්භවය හෝ සංක්‍රමණ තත්වය ඇති නිශ්චිත කණ්ඩායමකට අසාධාරණයක් සිදුවේනම්, වාර්ගීය වශයෙන් වෙනසකට ලක්කිරීම සිදුවේ. මෙය 'අනියම් ලෙස වෙනසකට ලක් කිරීමක්' ලෙස හැඳින්විය හැකිය. උදාහරණ වශයෙන් සමාගමක සේවකයන් විසින් වැඩකරන විට තොප්පි හෝ වෙනත් හිස් වැසුම් පැලඳීම නොකල යුතු බව කියයි නම්, ඒ මගින් සමහර වාර්ගික/ජාතික පසුබිම්වල අයට අසාධාරණයක් විය හැකි බැවින් මෙය අනියම් ලෙස වෙනසකට ලක් කිරීමක් විය හැකිය.

## වාර්ගික ද්වේශය යනු කුමක්ද?

පුද්ගලයෙකුගේ වාර්ගිකබව, සමෙහි වර්ණය, ජාතිය හේ වාර්ගික සම්භවය හෝ මිනිසුන් කණ්ඩායමක් හට **තරහා ඇති කරන, අපහාස කරන, ලැජ්ජාව ඇති කරන හෝ තර්ජනය කරන** කිසියම් දෙයක් ප්‍රසිද්ධියේ කිරීම නීතියට පටහැනිය.

වාර්ගික ද්වේශයට උදාහරණ වශයෙන් පහත වාර්ගික දේ ඇතුලත්වේඃ

- ඊ-ෆෝරම්, බ්ලොග්, සමාජ ජාල වෙබ් අඩවි සහ වීඩියෝ වෙබ් අඩවි ඇතුළු ඉන්ටර්නෙට්හි තරහා ඇතිකරන දේවල්
- පුවත්පත්, සඟරා, අත් පත්‍රිකා හෝ පත්‍රිකා වැනි තරහා ඇතිකරන අදහස් දැක්වීම් හෝ පිංතූර
- ප්‍රසිද්ධ රැළියක තරහා ඇති කරන කථා
- සාප්පුවක, වැඩකරන ස්ථානයක, උද්‍යානයක, පොදු ප්‍රවාහනවල හෝ පාසල් වැනි පොදු ස්ථානවල අපවාදාත්මක ලෙස අදහස් දැක්වීම්
- ක්‍රීඩා ඉසව්වල ක්‍රීඩකයන්, ප්‍රේක්‍ෂකයන්, පුහුණුකරුවන් හෝ නිලධාරීන් විසින් අපවාදාත්මක ලෙස අදහස් දැක්වීම.

## වර්ගය පදනම්වූ ආක්‍රමණකාරී හැසිරීම නීති විරෝධී නොවන්නේ කුමන අවස්ථාවලද?

RDA මගින් අරමුණු කරන්නේ නිදහසේ සන්නිවේදනය කිරීමට ඇති අයිතිය ('භාෂණයේ නිදහස') සහ වාර්ගික ද්වේශයෙන් තොරව ජීවත්වීමේ අයිතිය අතර සමබරතාවයක් ඇති කිරීමවේ. RDA අනුව පහත දේවල් **"සාධාරණ ආකාරයට සහ සද්භාවයෙන් කරන්නේ නම්"**, නීති විරෝධී නොවේඃ

- **කලාත්මක වැඩක් හෝ රඟදැක්වීමක් -** උදාහරණ වශයෙන් නාට්‍යයක චරිතයක් මගින් වාර්ගික වශයෙන් තරහා ඇතිකරන ආකල්ප ප්‍රකාශ කිරීම.
- **නිර්ව්‍යාජ ශාස්ත්‍රීය හෝ විද්‍යාත්මක අරමුණු උදෙසා කරන ප්‍රකාශයක්, පළකිරීමක්, සාකච්ඡාවක් හෝ විවාදයක්** - උදාහරණ වශයෙන් සංක්‍රමණය, බහුසංස්කෘතිකභාවය හෝ නිශ්චිත කණ්ඩායම් සඳහා වන විශේෂ ක්‍රියා මාර්ග වැනි මහජන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම සහ තර්ක කිරීම.
- **මහජන උනන්දුව ඇති කරුණක් සම්බන්ධයෙන් සාධාරණ සහ නිවැරදි වාර්තාවක් සකස් කිරීම -** උදාහරණ වශයෙන් වාර්ගික වශයෙන් තරහා ඇති කරන හැසිරීම සම්බන්ධයෙන් පුවත් පතක පලවන සාධාරණ වාර්තාවක්.
- **සාධාරණ අදහසක් දැක්වීම,** අදාල අදහස් දැක්වීම, ප්‍රකාශය කරන අයගේ නිර්ව්‍යාජ විශ්වාසය වන අවස්ථාවල.

## වෙනසකට ලක් වීමක් හෝ වාර්ගික ද්වේශයක් සිදුවේනම්, මා විසින් කුමක් කල හැකිද?

අදාල පුද්ගලයා හෝ අදාල අය සමඟ කෙළින්ම ප්‍රශ්නය නැගීමට ඔබට අවශ්‍ය විය හැකිය.

මේ මගින් එය විසඳුනේ නැතිනම්, හේ එසේ කිරීමට ඔබට අපහසුනම්, ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමට පැමිණිලි කල හැකිය. ඔබ වෙනුවෙන් සොලිසිටර්වරයෙකු, අද්වකාත්වරයෙකු හෝ වෘත්තීය සමිතියක් මගින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කල හැකිය.

කොමිසම වෙත පැමිණිලි කිරීමට කිසිදු වියදමක් යනනේ නැත.

ඔබගේ පැමිණිල්ල ලිඛිතව විය යුතුය. ඔබ විසින් සම්පූර්ණකර තැපෑලෙන් හෝ ෆැක්ස් මගින් යැවීමට පැමිණිලි කිරීම සඳහාවූ පෝරමයක් ඇත. නැතිනම්, ඔබගේ පැමිණිල්ල වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගතව යොමුකල හැකිය. ඔබගේ පැමිණිල්ල ලිඛිතව ඉදිරිපත් කිරීමට නොහැකි නම්, ඒ සඳහා අප විසින් උපකාර කල හැකිය.

ඔබගේ පැමිණිල්ල වලංගුවීම සඳහා එය තර්කානුකූල විය යුතු අතර ඔබ විසින් පැමිණිලි කරන සිදුවීම් නීතිවිරෝධී ලෙස වෙනසකට ලක් කල යුතුය. එසේම, කුමක් සිදුවුයේද, සිදුවුයේ කවදාද, කොතැනදීද සහ එයට සම්බන්ධවූ අය සම්බන්ධ ප්‍රමාණවත් විස්තර ලබාදිය යුතුය.

පැමිණිල්ලක් ඕනෑම භාෂාවකින් විය හැකිය. ඔබට භාෂා හෝ භාෂණ පරිවර්තකයෙකු අවශ්‍යනම්, අප විසින් පිළියෙල කර දිය හැකිය.

## මා හට වැඩිදුර විස්තර ලබාගත හැක්කේ කෙසේද?

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම හා සම්බන්ධවීම සඳහා තොරතුරුඃ

**දුරකථන**
ජාතික තොරතුරු සේවාවඃ 1300 656 419 හෝ (02) 9284 9888
TTYඃ 1800 620 241
ෆැක්ස්ඃ (02) 9284 9611

**තැපැල්**

GPO Box 5218
Sydney NSW 2001

**මාර්ගගත**
ඊමේල්ඃ infoservice@humanrights.gov.au
වෙබ් අඩවියඃ www.humanrights.gov.au

පහත වෙබ් අඩවිය වෙත යාම මගින් මාර්ගගතවද ඔබගේ පැමිණිල්ල යොමුකල හැකියඃ
www.humanrights.gov.au/complaints_information/online_form/index.html.

ඔබ බිහිරිනම් හෝ ශ්‍රවණ ආබාධයක් ඇතිනම්, TTY දුරකථන අංක 1800 620 241 ඔස්සේ අප හා සම්බන්ධවිය හැකිය. ඔබට ඔස්ලන් භාෂණ පරිවරතකයෙකු අවශ්‍යනම් අප විසින් එය එළියෙල කර දිය හැකිය.

ඔබ අන්ධනම් හෝ දෘෂ්ඨි ආබාධයක් ඇතිනම්, ඉල්ලා සිටි අවස්ථාවල වෙනස් ආකාරයකට තොරතුරු ලබාදිය හැකිය.

### වාර්ගික ද්වේශත්වය පැමිණිලි සම්බන්ධ වෙනත් සම්බන්ධවිය හැකි ස්ථාන

මාධ්‍යවල ඇති කථාන්දර, ගුවන්විදුලි හෝ මාර්ගගතව අන්තර්ගත දේ සම්බන්ධයෙන් ඔබ කණස්සල්ලෙන් සිටීනම්, ඔබ විසින් ඕස්ට්‍රේලියානු සන්නිවේදන සහ මාධ්‍ය අධිකාරිය (Communications and Media Authority (ACMA)); වෙළඳ දැන්වීම් සඳහාවූ වෙළඳ දැන්වීම් සම්මතයන් පිළිබඳ මණ්ඩලය (Advertising Standards Board for advertisements); හෝ පුවත්පත් කථා සම්බන්ධ ඕස්ට්‍රේලියානු මාධ්‍ය කවුන්සිලය (Australian Press Council for newspaper stories) වෙත පැමිණිලි කල හැකිය. අදාල මාධ්‍ය ආයතනයේ කතෘ හෝ කළමණාකරු වෙතද පැමිණිලි කල හැකිය.

ඔබගේ අසල්වැසියන්ගේ ආක්‍රමණකාරී හැසිරීම සම්බන්ධයෙන් ඔබ කණස්සල්ලෙන් සිටීනම්, ගැටළුව විසඳා ගැනීම සඳහා ප්‍රජා සාධාරණ මධ්‍යස්ථානයක් (Community Justice Centre) සමග හෝ ඔබ රජයේ නිවාසවල පදිංචිවී සිටීනම් නිවාස දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකිය.

**ඔබට හිංසා කරන බවට තර්ජන ඇතිනම්, හෝ දරුණු ලෙස පහරදී ඇතිනම්, පොලිසිය වෙත යන්න.**

## සාමාන්‍ය නීති උපදෙස්

ඔබ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සලකා බලන්නේ නම්, නීති උපදෙස් ලබා ගැනීම හෝ ඔබගේ වෘත්තීය සමිතිය හා සම්බන්ධවීමට ඔබට අවශ්‍ය විය හැකිය. වෙනසකට ලක් කිරීම සහ අඩන්තේට්ටම් කිරීම සම්බන්ධ නොමිළේ උපදෙස් ලබාදෙන ප්‍රජා නීති සේවා ඇත. ඔබට සමීපම ප්‍රජා නීති මධ්‍යස්ථාන හා සම්බන්ධවීමේ විස්තර [www.naclc.org.au/directory](http://www.naclc.org.au/directory) වෙතින් ලබාගත හැකිය.

**වගකීමෙන් බැහැරවීම: මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු මාර්ගෝපදේශයක් වශයෙන් පමණක් ලබාදී ඇත. එය නිසි නීති උපදෙස්වලට ආදේශකයක් නොවේ.**